සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

පාලි I
பாளி I
Pali I

**74 STE I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොද දක්වන්න.**

---

**1.** පාලි භාෂාවේ අක්ෂර මාලාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පාලි හෝඩියට අයත් අක්ෂර සංඛ්‍යාව පිළිබඳ මතවාද නොමැත.
(2) පාලි වර්ණ මාලාවට ශ, ෂ යන අක්ෂර ද ඇතුළත් ය.
(3) පාලියේ වර්ගාන්තාක්ෂර සංඛ්‍යාත්මකව පහක් වේ.
(4) සංයුක්තාක්ෂරයකට මුලින් ඇති එ, ඔ දෙක දීර්ඝව උච්චාරණය වේ.

**2.** සමානාර්ථවත් පද යුගලය සහිත වරණය තෝරන්න.
(1) අන්තෙවාසිකො - සද්ධිවිහාරිකො
(2) උක්ලාපං - කචවරං
(3) සයං - සායං
(4) රමති - විරමති

**3.** නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි මණ්ඩලාරාම යන්නෙන් අදහස් වන්නේ පහත දැක්වෙන කවර විහාරය ද?
(1) අභයගිරිය
(2) ඉසුරුමුණිය
(3) වට්ටාරම
(4) සෑගිරිය

**4.** ප්‍රථම සංගීතියේ දී සංයුත්ත හා අංගුත්තර නිකායන් පවත්වාගෙන යාමට බාරදුන් මහරහතන් වහන්සේලාගේ නම් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
(1) අනුරුද්ධ, සාරිපුත්ත
(2) ආනන්ද, මහාකස්සප
(3) සාරිපුත්ත, ආනන්ද
(4) මහාකස්සප, අනුරුද්ධ

**5.** සිදුහත් බෝසත් සිරිත අනාවරණය වන සූත්‍රයක් වන්නේ මේවායින් කවරක් ද?
(1) අරියපරියෙසන
(2) අලගද්දූපම
(3) අග්ගඤ්ඤ
(4) අම්බට්ඨ

**6.** 'සකාය නිරුත්ති' යන්නෙන් පාලි භාෂාව අදහස් වන බව පවසන ලද්දේ පහත දැක්වෙන කවුරුන් විසින් ද?
(1) යමෙළු, තෙකුල භික්ෂූන් දෙනම
(2) අර්ථකථාචාර්ය බුද්ධඝොෂ හිමි
(3) පොල්වත්තේ බුද්ධදත්ත හිමි
(4) මහාචාර්ය රීස් ඩේවිඩ්ස්

**7.** කෙසපුත්තිය කාලාම සූත්‍රය ඇතුළත් වන්නේ අංගුත්තරනිකායේ
(1) තික නිපාතයට ය.
(2) පඤ්චක නිපාතයට ය.
(3) අට්ඨක නිපාතයට ය.
(4) දසක නිපාතයට ය.

**8.** දීපවංසය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පජ්ජපදොරුවංස යනු මෙයට අපර නාමයකි.
(2) මෙහි ඇතුළත් පරිච්ඡේද සංඛ්‍යාව 36කි.
(3) බුද්දකනිකාය පර්යාපන්න ග්‍රන්ථයකි.
(4) උපතිස්ස නම් තෙර නමක් විසින් ලියන ලද්දකි.

**9.** "**නොනීතසුකුමාලං මං ජාතපල්ලවකොමලං ...**" යනාදි පාඨයෙහි '**නොනීත**' යන්නෙහි තේරුම කවරක් ද?
(1) අවිනීත (2) අතිශය (3) නෙළුම් (4) වෙඬරු

● පහත ගාථා කියවා **10** සිට **13** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එවං තෙනානුසිට්ඨො'හං - නායකෙන හිතෙසිනා,
ගිජ්ඣකූටං සමාරුය්හ - ඣායාමි ගිරිකන්දරෙ.

ඨිතො පබ්බතපාදම්හි - මමාහ සො මහාමුනි,
වක්කලී'ති ජිනො වාචං - තං සුත්වා මුදිතො අහං.

පක්ඛන්දිං සෙලපබ්භාරෙ - අනෙකසතපොරිසෙ,
තදා බුද්ධානුභාවෙන - සුඛෙන'ව මහිං ගතො.

**10.** කත්ථ ඨිතො භගවා වක්කලී'ති ආමන්තෙසි?
(1) ගිරිකන්දරෙ (2) පබ්බතපාදම්හි
(3) ගිජ්ඣකූටෙ (4) අනෙකසතපොරිසමජ්ඣෙ

**11.** කථං සො සෙලපබ්භාරා මහිං ගතො?
(1) ආකාසෙන (2) ඣානබලෙන
(3) පදසා (4) දසබලානුභාවෙන

**12.** ඉහත පළමු ගාථාවෙහි වඩාත් නිවැරදි අන්වය දැක්වෙන වරණය තෝරන්න.
(1) හිතෙසිනා තෙන නායකෙන එවං අනුසිට්ඨො අහං ගිජ්ඣකූටං සමාරුය්හ ගිරිකන්දරෙ ඣායාමි.
(2) ගිජ්ඣකූටං සමාරුය්හ හිතෙසිනා තෙන නායකෙන එවං අනුසිට්ඨො අහං ගිරිකන්දරෙ ඣායාමි.
(3) එවං අනුසිට්ඨො අහං ගිජ්ඣකූටං සමාරුය්හ ගිරිකන්දරෙ හිතෙසිනා තෙන නායකෙන ඣායාමි.
(4) අහං හිතෙසිනා තෙන නායකෙන ගිජ්ඣකූටං සමාරුය්හ ගිරිකන්දරෙ අනුසිට්ඨො එවං ඣායාමි.

**13.** ඉහත ගාථා පඞ්ක්තිය අනුව වක්කලී තෙරණුවන් ගිරිකඳුරට නැගී කුමක් කළේ ද?
(1) මැරෙන්නට සිතී ය. (2) බවුන් වැඩුවේ ය.
(3) බුදුරුව බලමින් සිටියේ ය. (4) බුදුරදුන්ගේ අනුශාසනාවට සවන් දුන්නේ ය.

**14.** චුල්ලවග්ගපාළියෙහි අන්තර්ගත ඛන්ධක සංඛ්‍යාව කෙතෙක් ද?
(1) දහයකි. (2) එකොළොසකි. (3) දොළොසකි. (4) තෙළෙසකි.

**15.** **නිවාසන** සහ **සංඝාටි** යන පද දෙකෙන් අදහස් වන්නේ අනුපිළිවෙළින්,
(1) හඳනය හා සඟල සිවුර යි. (2) නිසීදනය හා හඳනය යි.
(3) සඟල සිවුර හා තනිපට සිවුර යි. (4) සඟල සිවුර හා හඳනය යි.

**16.** 'අම්හ' ශබ්දයේ ෂෂ්ඨී විභක්ති ඒකවචන රූප පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මය්හං, මෙ, අම්හාකං, මමං (2) අම්හං, අම්හාකං, මෙ, නො
(3) මම, මය්හං, මමං, මෙ (4) මය්හං, අම්හාකං, වො, නො

**17.** '**ඉතරා පජා**' යන්නෙන් අදහස් වන්නේ,
(1) අනෙක් මිනිස්සු ය. (2) ආදිකාලීන ප්‍රජාව ය.
(3) තරණය කළ අය ය. (4) එනම් ජනයා ය.

**18.** චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයට අනුව උෂ්ණ කාලයේ වා කවුළු,
(1) දිවා රාත්‍රි දෙකෙහි ම විවෘත කොට තැබිය යුතු ය.
(2) දිවා රාත්‍රි දෙකෙහි ම වසා තැබිය යුතු ය.
(3) දහවල් විවෘත කොට තබා, රාත්‍රියෙහි වසා තැබිය යුතු ය.
(4) දහවල් වසා තබා, රාත්‍රියෙහි විවෘත කොට තැබිය යුතු ය.

**19.** "**භොගා සන්නිචයං යන්ති, වම්මිකො'වුපචීයති**" යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
(1) අනුප්‍රාස (2) උපමා
(3) රූපක (4) ස්වභාවොක්ති

**20.** කම්මධාරය, තප්පුරිස හා ද්වන්ද සමාස පද අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) අනාකුලං, මහාමෙඝො, තිමණ්ඩලං
(2) කායකම්මං, මහාමතී, පාදමූලෙ
(3) උණ්හකාලො, අරියසාවකො, මිත්තාමච්චා
(4) ගහපතිපුත්තො, පත්තචීවරං, ගුණසාගරො

**21.** මිතුරාගේ පිරිහීමෙන් සතුටු නොවන අභිවෘද්ධියෙන් සතුටු වන කල්‍යාණ මිත්‍රයා ප්‍රකාශ වන වරණය කුමක් ද?
(1) අත්ථක්ඛායී (2) ආනුකම්පක
(3) උපකාර (4) සමානසුඛදුක්ඛ

**22.** මහාවංසයේ නිර්දිෂ්ට කොටස අනුව පහත කරුණු සලකා නිවැරදි ප්‍රකාශ යුගලය ඇතුළත් වරණය තෝරන්න.
A මුටසීව රජුගේ දෙවන පුත්‍රයා දේවානම්පියතිස්ස නම් වේ.
B මහා අරිට්ඨ ඇමතියා දේවානම්පියතිස්ස රජුගේ මාමා වේ.
C ධර්මාශෝක රජු අරිට්ඨ ඇමතියාට සෙන්පති තනතුරක් දුන්නේ ය.
D දේවානම්පියතිස්ස රජු දෙවනවර අභිෂේක ලැබුයේ පොසොන් පොහෝ දිනකදී ය.
(1) A හා C (2) A හා D
(3) B හා C (4) B හා D

**23.** අජ්ජතනී, පඤ්චමී හා සත්තමී ආඛ්‍යාත පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පාහෙසි, ආදාය, ධාවෙය්‍ය (2) ජානාමි, උට්ඨාය, දදෙය්‍යුං
(3) අගච්ඡි, වදන්තු, භජෙ (4) ඔවදි, භවතු, පසාදාය

**24.** 'රතනානීදිසානෙත්ථ' යන්නෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.
(1) රතනානි + ඊදිසානි + එත්ථ (2) රතනානි + ඒදිසානි + එත්ථ
(3) රතනා + න + ඊදිසානි + එත්ථ (4) රතනා + ඒදිසා + න + එත්ථ

**25.** "මා චින්තයි මහාරාජ" යන්නෙහි නිවැරදි තේරුම කුමක් ද?
(1) මහරජතුමනි, මම මේ ගැන සිතුවෙමි. (2) මහරජතුමනි, මා ගැන නො සිතන්න.
(3) මහරජ, නො සිතුව මැනවි. (4) මහරජ, මෙය නො සිතා ඉන්න එපා.

**26.** නිපාත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) එවං, හවෙ, යථා (2) ඉව, සබ්බත්ථ, යෙසං
(3) සදා, සම්මා, තුම්හෙ (4) යදා, සචෙ, ලොකෙ

**27.** "දෙවො න සම්මා වස්සිස්සති" යන්නෙන් අදහස් වන්නේ,
(1) දෙවියා සුවසේ නො වසන්නේ ය. (2) දෙවියා මනාකොට වැසි නො වස්වයි.
(3) වැසි කලට දෙවියෝ සුවසේ නො වසති. (4) වැසි මනාකොට නො වසින්නේ ය.

**28.** 'චෙතසා' යන පදය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) චෙත ශබ්දයේ තතියා ඒකවචනය යි.
(2) චෙත ශබ්දයේ පංචමී බහුවචනය යි.
(3) චෙතස් ශබ්දයේ චතුත්ථී ඒකවචනය යි.
(4) චෙතස් ශබ්දයේ පඨමා බහුවචනය යි.

**29.** මහාසුපින ජාතකය අනුව 'විපරිවත්තනකාලෙ' යන්න විස්තර කිරීමට අදාළ නොවන පාඨය ඇතුළත් වරණය තෝරන්න.
(1) අකාරණස්ස කාරණන්ති ගහණකාලෙ (2) කාරණස්ස අකාරණන්ති ඡඩ්ඩනකාලෙ
(3) අභූතස්ස භූතන්ති ගහණකාලෙ (4) ලජ්ජීනං උස්සන්නකාලෙ

**30.** මල්ලිකා දේවිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) බුදුරදුන්ට මේළ පළඳනාවක් පිදූ කාන්තාවකි.
(2) ජීවිතයේ කිසිදු වරදක් නොකළ කාන්තාවකි.
(3) බුදුරදුන් ද පැසසූ පිවිත පරිඥානයක් තිබූ කාන්තාවකි.
(4) බිම්බිසාර රජතුමාගේ අගමෙහෙසිය යි.

**31.** අග්ගබ්‍රාහ්මණො යන්න,

(1) සන්ධියකි.
(2) සමාසයකි.
(3) තද්ධිතයකි.
(4) කිතකයකි.

**32.** "කණ්හං ධම්මං විප්පහාය, ......................... භාවෙථ පණ්ඩිතො" මෙහි හිස්තැනට අදාළ වචනය තෝරන්න.

(1) අසතං
(2) චිත්තං
(3) ධම්මං
(4) සුක්කං

**33.** සොළොස් මහා සිහිනවලට අයත් නොවන සිහිනයක් සහිත වරණය තෝරන්න.

(1) රජ මාළිගාවෙහි දොරකඩ රන් කල පුරවා ගත් ඇමතියන් සිටිනු දැකීම
(2) මහත් කුළුගෙවල් වැනි මහගලක් නැවක් මෙන් පාවෙමින් තිබෙනු දැකීම
(3) දෙපස ම මුඛය ඇති අශ්වයකු මුඛ දෙකෙන් ම තණකොළ කනු දැකීම
(4) ලක්ෂයක් වටිනා සඳුන් හරයක් කුණු මෝරු ගණනට විකුණනු දැකීම

**34.** ලී වඩුවා යන අරුත දෙන පාලි වචනය කුමක් ද?

(1) උසුකාරා (2) තච්ඡකා (3) තසාවකා (4) නෙත්තිකා

**35.** අපදානපාළිය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) චරිතකථා ඇතුළත් ත්‍රිපිටක ග්‍රන්ථයකි.
(2) ඛුද්දකනිකායාගත එකොළොස් වන ග්‍රන්ථය යි.
(3) ථෙරාපදාන හා ථෙරී අපදාන යනුවෙන් එහි කොටස් දෙකකි.
(4) බුද්ධාපදාන හා පච්චෙකබුද්ධාපදානයන් ද මෙයට ඇතුළත් ය.

**36.** හේතු-ප්‍රත්‍යය සම්බන්ධය වැඩි වශයෙන් ම විවරණය කෙරෙන අභිධර්ම ග්‍රන්ථය මේවායින් කුමක් ද?

(1) ධම්මසංගණිප්පකරණය
(2) විභංගප්පකරණය
(3) පුග්ගලපඤ්ඤත්තිප්පකරණය
(4) පට්ඨානප්පකරණය

**37.** සංඝාදිසෙස ශික්ෂාපදයක් කඩකළහොත් පිරිසිදු විය හැකි විනය කර්මයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අබ්භාන
(2) පරිවාස
(3) මානත්ත
(4) මූලායපටිකස්සන

**38.** පාලි මහාබොධිවංසයේ කතුවරයා වන්නේ මෙයින් කවරෙක් ද?

(1) විල්ගම්මුල තෙරණුවෝ
(2) උපතිස්ස තෙරණුවෝ
(3) වාචිස්සර තෙරණුවෝ
(4) වෙදෙහ තෙරණුවෝ

**39.** විරුද්ධාර්ථවත් පද යුගලය සහිත වරණය තෝරන්න.

(1) ආකාසං - ඔකාසං
(2) ආකුලං - සමාකුලං
(3) ඔකං - අනොකං
(4) ගාරං - අගාරං

**40.** "අසබ්භා ච නිවාරයෙ" යන පාඨයෙහි නිවාරයෙ යන්න,

(1) වත්තමානා මජ්ඣිමපුරිස ඒකවචන පදයකි.
(2) පඤ්චමී උත්තමපුරිස බහුවචන පදයකි.
(3) සත්තමී පඨමපුරිස ඒකවචන පදයකි.
(4) කාලාතිපත්ති මජ්ඣිමපුරිස ඒකවචන පදයකි.

**41.** පහත ගාථා පාදවලින් ගැළපෙන පාද යුගලය සහිත වරණය තෝරන්න.

A - පණ්ඩිතො සීලසම්පන්නො
D - භමරස්සෙව ඉරීයතො
B - නිවාතවුත්ති අත්ථද්ධො
E - තාදිසො ලභතෙ යසං
C - භොගා සන්නිචයං යන්ති
F - ජලං අග්ගීව භාසති

(1) A හා D (2) B හා E (3) B හා F (4) C හා E

**42.** මනාව ශිල්ප හැදෑරීම ශිෂ්‍යයකු විසින් ගුරුවරයකුට කෙරෙන උසස් සංග්‍රහයක් වන්නේ පහත දැක්වෙන කවර හේතුවක් නිසා ද?
(1) ගුරු සිසු සබඳතාව ශක්තිමත් වන නිසා ය.
(2) ශිෂ්‍යයා විසින් තම වගකීම ඉටු කරන නිසා ය.
(3) ශිෂ්‍යයා ගුණවත් අයෙක් වන නිසා ය.
(4) ගුරුවරයා කෙරෙහි ගරු සත්කාර දක්වන නිසා ය.

**43.** තෙවන සංගායනාවට ගතවූ කාලය වන්නේ
(1) තෙ මසකි. (2) සිවු මසකි. (3) හත් මසකි. (4) නව මසකි.

**44.** ත්‍රිවිද්‍යා අනුපිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
(1) පුබ්බෙනිවාසානුස්සති, චුතූපපාත, ආසවක්ඛය
(2) ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්තවිජානන
(3) සුතමයපඤ්ඤා, චින්තාමයපඤ්ඤා, භාවනාමයපඤ්ඤා
(4) ඤාතපරිඤ්ඤා, තීරණපරිඤ්ඤා, පහානපරිඤ්ඤා

**45.** පාලි වංසකථාවක ප්‍රධාන ලක්ෂණයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) බුදුසිරිත හා බැඳුණු වස්තුවක් හෝ සිද්ධියක් ආශ්‍රය කොට ගැනීම
(2) ඓතිහාසික තොරතුරු මගින් අවිච්ඡින්න පරම්පරා කථාවක් ගෙනහැර දැක්වීම
(3) රජවරුන්ගේ ශාසනික සේවාව පමණක් පෙන්වා දීම
(4) ධර්ම රසය, අර්ථ රසය හා පහන් සංවේගය ජනනය කිරීම

**46.** "**තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන ...**" යන්නෙහි **තිමණ්ඩලය** හෙවත් තුන් මඬුලු යනු කවරක් ද?
(1) නැබ, ගොප්මස, වළලුකර (2) නැබ හා දෙදණ
(3) දෙවුර හා නැබ (4) උරය, නැබ, ගොප්මස

**47.** 'කොට්ටය' යන්න සඳහා යෙදෙන පාලි වචනය තෝරන්න.
(1) මඤ්චපටිපාදකං (2) භුම්මත්ථරණං (3) පච්චත්ථරණං (4) බිම්බොහනං

**48.** සමාජ සම්බන්ධතා විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රධාන කරුණක් වන්නේ,
(1) ආගමික සබඳතා ප්‍රමුඛ කොට සලකා ක්‍රියා කිරීමයි.
(2) අන්‍යයන්ගේ කටයුතු තමා විසින් ඉටු කිරීමයි.
(3) ගරුකළයුත්තන්ට පමණක් ගරු කිරීමයි.
(4) තම භූමිකාව හැඳින යුතුකම් හා වගකීම්වලට බැඳී සිටීමයි.

**49.** ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
(1) මම අට්ඨන්නං භාතරානං චතුත්ථො දුක්ඛං වසති.
(2) අයං පඤ්චදාරකා අභිණ්හං මග්ගෙ කීළන්ති.
(3) භගවා පඨමං වස්සෙ බාරාණසියං ඉසිපතනෙ විහරි.
(4) තස්මිං වනෙ බහවො උච්චා රුක්ඛා හොති.

**50.** "**එකං මාරෙත්වා එකස්ස සොත්ථිකම්මස්ස කරණං නාම නත්ථි**" මෙම පාඨයට වඩාත් සුදුසු තේරුම සහිත වරණය කවරක් ද?
(1) එකෙක් මැරුණට පස්සේ තවෙකෙකුට උදව් කරලා වැඩක් නැහැ.
(2) එකෙක් මැරී තවෙකෙකුගේ යහපතට වැඩ කරලා වැඩක් නැහැ.
(3) එකෙක් මරා තවෙකෙකුට ශාන්ති කර්ම කරනවා කියලා දෙයක් නැහැ.
(4) එකෙකු මරා තවෙකෙක් ජීවත් කරන්නට හේතුවක් නැහැ.

***